# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,555 — 1965 නොවැම්බර් 12 වැනි සිකුරාද — 1965.11.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

12 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනයයි

අධ්‍යාපන අධ්‍යක්ෂ නැන්පත් අර්නස්ට් හර්බට් ද අල්විස් වන මම, 1965 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ එකොළොස් වෙනි දින අංක 14,503 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ නියෝගයෙන් සංශෝධිත පරිදි, 1962 වර්ෂයේ සැප්තැම්බර් 8 වැනි දින අංක 13,296 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද හලා/වෙන්නප්පුව රෝමානු කතෝලික පිරිමි පාසැලේ සියළුම දේපල රජය වෙනුවෙන් භාර ගැනීමට, වෙන්නප්පුවේ පාඨශාලා පරීක්ෂක නැන්පත් තම්මිටහෙට්ටිමුදලිගේ දොන් විල්ප්‍රඩ් මාටින් පීරිස් මහතාට මෙසින් බලය පවරමි.

2. එකී තම්මිටහෙට්ටිමුදලිගේ දොන් විල්ප්‍රඩ් මාටින් පීරිස් මහතා රජය වෙනුවෙන් පූර්වෝක්ත දේපල භාර ගැනීම වැලැක්වීමට හෝ බාධා කිරීමට හෝ විරෝධය දැක්වීමට උත්සාහ කරන සැම පුද්ගලයෙක්ම එකී පනත යටතේ වරදකරු වෙනවා පමණක් නොව, එකී පනතේ 27 වැනි වගන්තිය යටතේ දඬුවම්වට භාජන කරනු ලැබිය හැකිද වේ.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

ජපාඅබ/295/සාපා.
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය,
කොළඹ 2,
1965 නොවැම්බර් මස 9 දින දිය.

11-569/1

---

### 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

12 (2) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

වෙන්නප්පුවේ පාඨශාලා පරීක්ෂක නැන්පත් තම්මිටහෙට්ටිමුදලිගේ දොන් විල්ප්‍රඩ් මාටින් පීරිස් වන මම, 1965 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ එකොළොස් වැනි දින අංක 14,503 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ නියෝගයෙන් සංශෝධිත පරිදි, 1962 වර්ෂයේ සැප්තැම්බර් 8 වැනි දින අංක 13,296 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පැනවුණු පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද හලා/වෙන්නප්පුව රෝමානු කතෝලික පිරිමි පාසැලට අයත් දේපල 1965 වර්ෂයේ නොවැම්බර් මාසයේ විසිපස් වැනි බ්‍රහස්පතින්දා පෙරවරු නවයට, එකී හලා/වෙන්නප්පුව රෝ. ක. පිරිමි පාසැලේ දී රජය සඳහාද, වෙනුවෙන්ද භාර ගැනීමට අදහස් කරන බව එම පාසැලේ දේපල ගැන අයිතිවාසිකම් ඇති සියළු දෙනා වෙතම මෙසින් දැනුම් දෙමි.

(2) එම දේපල වලට අයිතිවාසිකමක් ඇති සියළු දෙනාම නැත හොත් ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින් මෙහි (1) ඡේදයෙහි සඳහන්වූ දිනයන්හි නියමිත වේලාවට එකී ස්ථානය වෙත, පැමිණ එම දේපල රජය සඳහාද, වෙනුවෙන්ද භාර ගැනීමට මට දැඩ දෙන ලෙසත්, සහාය වන ලෙසත් මෙසින් නියෝග කරමි.

ට. ඩී. ඩබ්ලිව්. ඇම්. පීරිස්,
පාඨශාලා පරීක්ෂක.

1965 නොවැම්බර් මස 9 දින,
වෙන්නප්පුවේ දිය.

11-569/2

---

### 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

12 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනයයි

අධ්‍යාපන අධ්‍යක්ෂ නැන්පත් අර්නස්ට් හර්බට් ද අල්විස් වන මම, 1965 වර්ෂයේ අගෝස්තු මාසයේ 24 වෙනි දින අංක 14,489 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද හලා/මාරවිල ශාන්ත මේරි පිරිමි පාසැලේ සියළුම දේපල රජය වෙනුවෙන් භාර ගැනීමට, නාත්තන්ඩියේ පාඨශාලා පරීක්ෂක නැන්පත් කදිනප්පුලිගේ වර්ලියානු ප්‍රනාන්දු මහතාට මෙසින් බලය පවරමි.

2. එකී කදිනප්පුලිගේ වර්ලියානු ප්‍රනාන්දු මහතා රජය වෙනුවෙන් පූර්වෝක්ත දේපල භාර ගැනීම වැලැක්වීමට හෝ බාධා කිරීමට හෝ විරෝධය දැක්වීමට උත්සාහ කරන සැම පුද්ගලයෙක්ම එකී පනත යටතේ වරදකරු වෙනවා පමණක් නොව, එකී පනතේ 27 වැනි වගන්තිය යටතේ දඬුවම්වට භාජන කරනු ලැබිය හැකිද වේ.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

ජපාඅබ/270/සාපා.
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය,
කොළඹ 2,
1965 නොවැම්බර් මස 9 දින දිය.

11-569/3

## 1961 වර්‍ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 12 (2) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

නාත්තන්ඩියේ පාඨශාලා පරීක්ෂක නැන්පත් කදිනප්පුලිගේ වර්ලියානු ප්‍රනාන්දු වන මම, 1965 වර්ෂයේ අගෝස්තු මාසයේ (24) විසිහතර වැනි දින අංක 14,489 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ 1961 වර්‍ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පැනවුනු පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද හල/මාරවිල ශාන්ත මේරි පිරිමි පාසලට අයත් දේපල 1965 වර්‍ෂයේ නොවැම්බර් මාසයේ 30 වැනි අඟහරුවාදා පෙරවරු 10 ට, එකී හල/මාරවිල ශාන්ත මේරි පිරිමි පාසැල්හිදී රජය සඳහාද, වෙනුවෙන්ද භාර ගැනීමට අදහස් කරන බව එම පාසැලේ දේපල ගැන අයිතිවාසිකම් ඇති සියළු දෙනා වෙතම මෙයින් දැනුම් දෙමි.

(2) එම දේපල වලට අයිතිවාසිකමක් ඇති සියළු දෙනාම නැත හොත් ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින් මෙහි (1) ඡේදයෙහි සඳහන්වූ දිනයන්හි නියමිත වේලාවට එකී ස්ථානය වෙත, පැමිණ එම දේපල රජය සඳහාද, වෙනුවෙන්ද භාර ගැනීමට මට ඉඩ දෙන ලෙසත් සහාය වන ලෙසත් මෙයින් නියෝග කරමි.

ජේ. ඩබ්ලිව්. ප්‍රනාන්දු
පාඨශාලා පරීක්ෂක.

1965 නොවැම්බර් මස 9 දින දීය.

11-569/4

ලංකාවේ වැලව්වේතයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රපිතයි